නීතිපති දෙපාර්තමේන්තුව

சட்டமா அதிபதி திணைக்களம்

Attorney General's Department



# කාර්ය සාධන වාර්තාව - 2018

# Performance Report - 2018

# செயலாற்றுகை அறிக்கை - 2018

# පටුන

<u>අන්තර්ගතය</u> <u>පිටු අංකය</u>


| | | | |
|---|---|---|---|
| 1. | නීතිපති දෙපාර්තමේන්තුවේ පසුබිම | | 3 |
| 2. | නීතිපති දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | | 4 |
| 3. | කාර්ය මණ්ඩල තොරතුරු | | 5 |
| 4. | නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය | | 6 |
| i. | අපරාධ නඩු අංශය | | 7-21 |
| ii. | සිවිල් අංශය | | |
| iii. | රාජ්‍ය නීතිඥ අංශය | | |
| iv. | ශ්‍රේෂ්ඨාධිකරණ අංශය | | |
| v. | සංස්ථා අංශය | | |
| vi. | ළමා අපචාර නඩු ඒකකය | | |
| vii. | මහජන පැමිණිලි ඒකකය | | |
| | • නඩු අංශවල කාර්ය සාධනය සංක්ෂිප්තව | 16 | |
| viii. | ආයතන අංශය | 17-19 | |
| ix. | සැලසුම් අංශය | 20 | |
| x. | ගිණුම් අංශය | 21 | |

## දැක්ම

- ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරීම.

## අරමුණ

- ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දී සුවිශේෂී මෙහෙවරක් ඉටු කිරීම.

## මෙහෙවර

- ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනීයවත්, අභිමානවත් ලෙසත්, අවංක ලෙසත් කටයුතු කිරීම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරීම.

- සමාජීය  ආර්ථික සෞභාග්‍ය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්වීමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකීය ජනතාව උදෙසා සාධාරණත්වය , ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතීන් ක්‍රියාත්මක කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දරනු ඇත.

# නීතිපති දෙපාර්තමේන්තුව

## (තැ.පෙ. අංක 502, කොළඹ 12.)


**01. පසුබිම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් ගරු නීතිපතිතුමා කටයුතු කරයි. "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව මධ්‍යම රජයට, පළාත් සභාවලට, රජයේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනිකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහාය ලබාදෙයි. එකී සහාය ලබාදීමේ දී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩුවලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශවලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය, ළමා අපචාර නඩු ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය, ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මකව පවතී.

## 02. නීතිපති දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 03. කාර්ය මණ්ඩල තොරතුරු (2018.12.31 දිනට)

| සේවක කාණ්ඩ මට්ටම | තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | නීතිපති | 1 | 1 | - |
| | සොලිසිටර් ජනරාල් | 1 | 1 | - |
| | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 2 | 2 | - |
| | අතිරේක සොලිසිටර් ජනරාල් | 9 | 9 | - |
| | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 9 | 9 | - |
| | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 19 | 14 | 5 |
| | ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ | 56 | 27 | 29 |
| | රජයේ අධිනීතිඥ | 218 | 153 | 65 |
| | සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) | 130 | 8 | 122 |
| | ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ | 1 | 1 | - |
| | රාජ්‍ය නීතිඥ | 2 | 1 | 1 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 6 | 6 | - |
| | සහකාර රාජ්‍ය නීතිඥ | 18 | 6 | 12 |
| | කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 28 | 12 | 16 |
| | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | - | 1 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරි | 3 | 2 | 1 |
| | පුස්තකාලයාධිපති (අධි පන්තිය) | 1 | 1 | - |
| | භාෂා පරිවර්තක | 8 | 7 | 1 |
| | සංඛ්‍යාලේඛන නිලධාරි | 1 | 1 | - |
| ද්විතීය මට්ටම | සංවර්ධන නිලධාරි | 3 | 2 | 1 |
| | පුස්තකාලයාධිපති (I, II) | 2 | - | 2 |
| | පුස්තකාලයාධිපති (III) | 2 | 2 | - |
| | තොරතුරු තාක්ෂණ සහකාර | 5 | - | 5 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | 180 | 159 | 21 |
| | සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 | - |
| | පෞද්ගලික ලේකම් | 1 | 1 | - |
| | ලඝු ලේඛක | 78 | 1 | 77 |
| | දෙපාර්තමේන්තුගත ලිපිකරු | 25 | 24 | - |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 137 | 89 | 48 |
| | කාර්යාල සේවක සේවය | 239 | 210 | 29 |
| | දෙපාර්තමේන්තුගත කාර්යාල සේවක සේවය | 20 | 20 | - |
| | මුරකරු | 7 | 3 | 4 |
| | නඩත්තු සහායක | 2 | - | 2 |
| එකතුව | | 1218 | 775 | 443 |

සටහන : අයවැය සහකාර තනතුර සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කර ඇත.

## 04. නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කරුණු, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීම.
- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්වය සභාවල පවරා ඇති නඩු සම්බන්ධයෙන් රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.
- නව නීති සම්මත කිරීමේදී හා පවතින නීති සංශෝධනය කිරීමේදී අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මක වේ.

එම ඒකක වන්නේ,

- මහජන පෙත්සම් ඒකකය (මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.)
- ළමා අපචාර නඩු ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමට අදාල නඩු පිළිබඳ ක්‍රියා කිරීම.)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර, නීතිපති  දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයේ කාර්ය සාධනය පහත පරිදි සාරාංශ කර දැක්විය හැක.

## i. අපරාධ අංශය

මහේස්ත්‍රාත් අධිකරණ වලින් සෘජුවම හෝ පොලිස් දෙපාර්තමේන්තුවෙන්, උපදෙස් පතා අපරාධ නඩු විශාල සංඛ්‍යාවක් මෙම අංශයට ලැබෙන අතර, මහාධිකරණයේ හෝ මහේස්ත්‍රාත් අධිකරණයේ අපරාධ නීති කෘත්‍යයන් පැවරීම සිදු කරනු ලබයි.

එකී නඩු පිටපත් ලැබුණු පසු නීතිපති දෙපාර්තමේන්තුවේ ගොනුවක් විවෘත කරනු ලබන අතර, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ප්‍රතිපාදනයන්ට අනුව ඒ සඳහා කටයුතු කෙරෙනු ඇත.

මෙම ක්‍රියාවලියේදී සැකකරුවන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම හෝ සාක්ෂි ප්‍රමාණවත් නොවීම මත සැකකරුව නීති කෘත්‍යයෙන් නිදහස් කිරීම හෝ මහාධිකරණයට සෘජුවම අධිචෝදනා යැවීම සිදු කෙරේ. අපරාධ අංශයට අනුයුක්තව නිලධාරින් 125 දෙනෙකු සිටින අතර, ශ්‍රී ලංකාවේ සෑම මහාධිකරණයටම අපරාධ අංශයේ එක් නිලධාරියෙකු අනුයුක්ත කර ඇත

**වරදේ ස්වභාවය අනුව වර්ග කරන ලද විෂයයන්**

| | |
|---|---|
| CR 1 - | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ශනය කරනු ලබන නඩු |
| CR 2 - | මැතිවරණ වලට අදාල වැරදි සහ කොළඹ වංචා විමර්ශන කාර්යාංශය මගින් විමර්ශනය කරනු ලබන නඩු |
| CR 3 - | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි |
| CR 4 - | ණයපත් (ක්‍රෙඩිට් කාඩ්) වලට අදාල වැරදි |
| OW - | පීඩාකාරී ආයුධ පනත යටතේ වන වැරදි |
| EER/TR - | හදිසි අවස්ථා රෙගුලාසි පනතේ යටතේ වන වැරදි |
| AG/T - | පොලිස් භාරයේ සිටියදී සිදුවන වධහිංසා පැමිණිවීම් |
| I & E - | ආගමන හා විගමන පනත යටතේ වන වැරදි |
| MTA - | මාරක රිය අනතුරු වලට අදාල නඩු |

**පළාත් පදනම මත වර්ගීකරණය කරන ලද විෂයයන්**

පැරණි වර්ගීකරණය (2010.12.31 දින දක්වා විවෘත කරන ලද ගොනු)

CM 1, CM 2, CM 3, CW 1, CW 2, CW3, CW 4, CB 1, CB 2, CS 1, CS 2, CN

මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරි සුමටව ඉටු කරනු ලැබීම සහ පළාත් මට්ටමින් ගොනු හදුනා ගැනීම තහවුරු කරනු පිණිස 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අපරාධ නඩු ගොනු වර්ගීකරණය කිරීමේ නව ක්‍රමවේදයක් හදුන්වා දෙන ලද අතර, එය පහත දක්වා ඇත.

EP 1, EP 2, EP 3, EP 4, NP 1, NP 2, NP 3, NP 4, NCP 1, NCP 2, SP 1, SP 2, SP 3, SP 4, SP 5, CP 1, CP 2, CP 3, NWP 1, NWP 2, NWP 3, NWP 4, UP 1, UP 2, SGP 1, SGP 2, SGP 3, WP 1, WP 2, WP 3 , WP 4, WP 5, WP 6, MLA

**අපරාධ අංශයේ කාර්ය සාධනය**

ප්‍රගති වාර්තාව-අපරාධ අංශය (2018.01.01 සිට 2018.12.31 දක්වා)

| අනු අංකය | විෂයය | 2018.01.01 වන විට ඉතිරි ගොනු සංඛ්‍යා | විවෘත කළ ලිපි ගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කළ ගොනු සංඛ්‍යාව | වෙනත් | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | **CW3** | 81 | 0 | 2 | 2 | 6 | 0 | 71 |
| 2 | **CW4** | 34 | 0 | 0 | 0 | 1 | 0 | 33 |
| 3 | **SGP1** | 275 | 152 | 48 | 14 | 5 | 0 | 359 |
| 4 | **SGP2** | 155 | 21 | 20 | 14 | 7 | 0 | 134 |
| 5 | **SGP3** | 203 | 52 | 40 | 18 | 5 | 0 | 192 |
| 6 | **CR1** | 1894 | 290 | 140 | 61 | 10 | 4 | 1969 |
| 7 | **CR2** | 556 | 54 | 1 | 58 | 2 | 5 | 544 |
| 8 | **CR3** | 1595 | 828 | 956 | 91 | 17 | 0 | 1192 |
| 9 | **CR4** | 114 | 4 | 6 | 1 | 0 | 0 | 111 |
| 10 | **NWP1** | 465 | 80 | 72 | 18 | 14 | 0 | 441 |
| 11 | **NWP2** | 193 | 43 | 35 | 5 | 5 | 0 | 191 |
| 12 | **NWP3** | 121 | 29 | 20 | 3 | 0 | 0 | 127 |
| 13 | **NWP4** | 127 | 18 | 28 | 8 | 7 | 0 | 102 |
| 14 | **OW** | 309 | 68 | 136 | 10 | 17 | 1 | 213 |
| 15 | **AG/T** | 54 | 9 | 2 | 0 | 0 | 0 | 61 |
| 16 | **CS1** | 93 | 0 | 9 | 4 | 8 | 0 | 72 |
| 17 | **SP1** | 274 | 73 | 40 | 11 | 4 | 0 | 292 |
| 18 | **SP2** | 319 | 53 | 45 | 18 | 10 | 0 | 299 |
| 19 | **CS2** | 106 | 0 | 5 | 4 | 0 | 1 | 96 |
| 20 | **SP3** | 255 | 70 | 39 | 8 | 5 | 0 | 273 |
| 21 | **SP4** | 159 | 56 | 28 | 7 | 4 | 0 | 176 |
| 22 | **SP5** | 155 | 39 | 30 | 5 | 3 | 0 | 156 |
| 23 | **I & E** | 797 | 147 | 12 | 105 | 20 | 0 | 807 |
| 24 | **EER** | 31 | 19 | 4 | 1 | 1 | 0 | 44 |
| 25 | **TR** | 5 | 5 | 0 | 0 | 0 | 0 | 10 |
| 26 | **MTA** | 77 | 29 | 2 | 11 | 0 | 0 | 93 |
| 27 | **CR7** | 0 | 25 | 0 | 0 | 0 | 0 | 25 |

| අනු අංකය | විෂයය | 2018.01.01 වන විට ඉතිරි ගොනු සංඛ්‍යා | විවෘත කළ ලිපි ගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කළ ගොනු සංඛ්‍යාව | වෙනත් | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | **CN** | 20 | 0 | 2 | 1 | 0 | 0 | 17 |
| 2 | **EP1** | 157 | 25 | 27 | 13 | 5 | 0 | 137 |
| 3 | **EP2** | 130 | 26 | 15 | 8 | 2 | 0 | 131 |
| 4 | **EP3** | 92 | 33 | 18 | 6 | 0 | 0 | 101 |
| 5 | **EP4** | 91 | 27 | 13 | 10 | 2 | 1 | 92 |
| 6 | **NP1** | 168 | 53 | 39 | 15 | 3 | 4 | 160 |
| 7 | **NP2** | 140 | 19 | 30 | 10 | 1 | 0 | 118 |
| 8 | **NP3** | 41 | 25 | 22 | 1 | 1 | 0 | 42 |
| 9 | **NP4** | 59 | 15 | 15 | 7 | 1 | 1 | 50 |
| 10 | **CM1** | 98 | 0 | 7 | 3 | 1 | 0 | 87 |
| 11 | **NCP1** | 383 | 100 | 40 | 17 | 10 | 1 | 415 |
| 12 | **NCP2** | 164 | 36 | 22 | 4 | 1 | 0 | 173 |
| 13 | **CM2** | 57 | 0 | 6 | 1 | 1 | 0 | 49 |
| 14 | **CP1** | 346 | 163 | 63 | 35 | 11 | 3 | 397 |
| 15 | **CP2** | 86 | 22 | 15 | 10 | 2 | 0 | 81 |
| 16 | **CP3** | 150 | 59 | 31 | 9 | 5 | 1 | 163 |
| 17 | **CM3** | 91 | 0 | 6 | 2 | 1 | 0 | 82 |
| 18 | **UP1** | 297 | 61 | 41 | 16 | 4 | 0 | 297 |
| 19 | **UP2** | 188 | 47 | 17 | 12 | 4 | 0 | 202 |
| 20 | **CB1** | 34 | 0 | 1 | 4 | 0 | 0 | 29 |
| 21 | **CB2** | 57 | 0 | 5 | 1 | 1 | 0 | 50 |
| 22 | **WP1** | 977 | 178 | 132 | 99 | 16 | 2 | 894 |
| 23 | **CW1** | 51 | 0 | 6 | 1 | 3 | 0 | 41 |
| 24 | **WP5** | 236 | 60 | 21 | 18 | 3 | 0 | 240 |
| 25 | **WP6** | 459 | 47 | 42 | 31 | 5 | 2 | 425 |
| 26 | **CR5** | 94 | 26 | 3 | 8 | 2 | 4 | 103 |
| 27 | **CW1** | 86 | 0 | 7 | 4 | 5 | 0 | 70 |
| 28 | **WP2** | 188 | 37 | 54 | 14 | 1 | 0 | 156 |
| 29 | **WP3** | 337 | 100 | 91 | 30 | 8 | 0 | 308 |
| 30 | **WP4** | 356 | 76 | 21 | 21 | 3 | 0 | 376 |
| 31 | **WP7** | 0 | 26 | 12 | 2 | 0 | 0 | 12 |

## ii සිවිල් අංශය

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය හා සිවිල් අභියාචනා මහාධිකරණවල ගොනු කර ඇති අභියාචනා, රිට් ආඥා සහ ප්‍රතිශෝධන නඩු හා දිවයිනේ විවිධ දිසා අධිකරණ,මහේස්ත්‍රාත් අධිකරණ වල ගොනු කරනු ලබන සිවිල් නඩු ඇතුළුව සියලුම සිවිල් හා වාණිජ නඩු වෙනුවෙන් සිවිල් අංශය කටයුතු කරයි. නීති සංශෝධනය කිරීම සහ නව නීති සම්මත කිරීම වැනි කාර්යයන් වලදී උපදෙස් ලබාදීමත්, පාර්ලිමේන්තුවේ ඒ ඒ කටයුතු සඳහා සහභාගීවීමත් උපදෙස් ලබාදීමත් සිදු කරනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තු වෙත නීති උපදෙස් ලබා දීම, විදේශ ණය ලබා ගැනීම සඳහා උපදෙස් දීම, රජය හා රාජ්‍ය ආයතන සමග ඇති වන ගිවිසුම සඳහා උපදෙස් ලබා දීම මානව හිමිකම් කොමිසම විසින් යොමු කරනු ලබන කරුණු. නඩු පැවරීමේ දැන්වීම් පිළිබඳ නඩු, බේරුම්කරණ නඩු, ඉඩම් අත්පත් කර ගැනීමේ නඩු සහ රජයේ ඉඩම් වල අයිතිය නැවත ලබා ගැනීම සම්බන්ධ නඩු ආදිය සිවිල් අංශයේ නිලධාරින් විසින් මෙහෙයවනු ලබන නඩු කටයුතු වලින් කිහිපයක් වේ.

අභියාචනාධිකරණය, දිසා අධිකරණය, පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ සහ කම්කරු විනිශ්චය සභා ආදීන් හී සිවිල් නඩු මෙහෙයවීම සඳහා සිවිල් අංශයට අනුයුක්තව නිලධාරන් 126 දෙනෙකු සිටිති. ඔවුන්ගේ රාජකාරීන්ට අමතරව නෛතික ගැටලු පිළිබඳව රජයේ දෙපාර්තමේන්තු වෙත උපදෙස් ලබා දීම, විවිධ තාක්ෂණ කමිටු වලට සහභාගිවීම, දේශිය හා ජාත්‍යන්තර බේරුම්කරණයන් සඳහා පෙනී සිටීම සහ නෛතික වෘත්තිකයන්ගේ අනිසි හැසිරීම් වලට එරෙහිව ගොනු කරන ලද රීතිමය කරුණු සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටීම ආදිය සඳහා ද මෙම නිලධාරිහු සහභාගි වේ.

**සිවිල් අංශයේ වර්ගීකරණය කර ඇති විෂයයන්**

E - නීති උපදෙස්
FC – විදේශ ණය ලබා ගැනීම සඳහා උපදෙස් ලබා දීම.
CA/SC - ශ්‍රේෂ්ඨාධිකරණ නඩු
CA/CA – අභියාචනාධිකරණ නඩු
CA/HC – මහාධිකරණ නඩු
HRC – මානව හිමිකම් කොමිසමට අදාල කරුණු
B – පනත් කෙටුම්පත්
CA/NA – නඩු පැවරීමේ දැන්වීම්
CA/DC – දිසා අධිකරණ නඩු
ARB – බේරුම්කරණ නඩු
C – රජයට එරෙහිව ගොනු කරන නඩු (රජයට ප්‍රතිපූර්ණ කිරීම)
CL – අවබෝධතා ගිවිසුම් සම්බන්ධ උපදෙස් ලබා දීම
CE – රජයේ ඉඩම් වල අයිතිය නැවත ලබා ගැනීම
AA – රීතිමය කරුණු
AV - ගුවන් සේවා පිළිබඳ නඩු
CA/LT – කම්කරු විනිශ්චය සභා නඩු
CA/MC - මහේස්ත්‍රාත් අධිකරණ නඩු

<u>**සිවිල් අංශයේ කාර්ය සාධනය**</u>

| විෂයය | විවෘත කළ ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කළ ගොනු සංඛ්‍යාව | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| E | 482 | 266 | 216 |
| FC | 31 | 12 | 19 |
| CL | 173 | 172 | 1 |
| C | 195 | 89 | 106 |
| CE | 12 | 04 | 08 |
| B | 77 | 44 | 33 |
| CA/SC | 142 | **මෙම ගොනු වලට අදාලව ඉදිරි වැඩකටයුතු රාජ්‍ය නීතිඥ අංශයෙන් සිදුවේ** | |
| CA/CA | 447 | | |
| CA/HC | 385 | | |
| CA/DC | 470 | | |
| CA/NA | 382 | | |
| CA/MC | 40 | 9 | 31 |
| CE/MC | 34 | 13 | 21 |
| CA/LT | 5 | 1 | 4 |
| ARB | 8 | 1 | 7 |
| HRC | 2 | 0 | 2 |
| AA | 5 | 1 | 4 |
| **Total** | **2890** | **612** | **452** |

සිවිල් අංශයෙන් විවෘත කරනු ලබන ගොනු වලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබයි .

### iii. රාජ්‍ය නීතිඥ අංශය

සිවිල් අංශය මගින් විවෘත කරනු ලබන ගොනු රාජ්‍ය නීතිඥ අංශයට ලැබෙන අතර, ඉන්පසුව දිවයින පුරා පිහිටි සිවිල් අධිකරණ වලදී එම නඩු සඳහා පෙනී සිටීම සිදු වේ.

රාජ්‍ය නීතිඥවරුන් **2** දෙනෙකු ද ඇතුළුව නිලධාරින් **26** දෙනෙකු රාජ්‍ය නීතිඥ අංශයේ සේවය කරනු ලබන අතර, ඔවුනට අමතරව සිවිල් නඩු සඳහා උපදෙස් ලබා දීමේ කාර්යයට සහභාගී වන රජයේ නීතිඥවරුන්ගෙන් සමන්විත ජාලයක් ද ඔවුන් සතු වෙයි. (කලින් රජයේ පෙරකදෝරු ලෙස හැඳින්වූ)

මෙම ශාඛාව වාර්ෂිකව අති විශාල සිවිල් නඩු සංඛ්‍යාවක් මෙහෙයවනු ලබන අතර, මෙම වසර තුළදී සිවිල් නඩු **4137** ක් අවසන් කර ඇත.

### iv. ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය

මෙය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලබන නඩු පමණක් මෙහෙයවනු ලබන විශේෂ ඒකකයකි.

අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් නිලධාරින් **11** දෙනෙකු සහ අනෙකුත් ශ්‍රේණි වල නිලධාරින් මෙම ඒකකයේ සේවය කරති.

2018 වර්ෂය තුළදී මූලික අයිතිවාසිකම් නඩු ද ඇතුළුව නඩු විශාල සංඛ්‍යාවක් මෙම ඒකකය මගින් මෙහෙයවනු ලැබිණි.

2018 වර්ෂය තුළදී ගොනු **847** ක් විවෘත කරන ලද අතර, නඩු **498** ක් මෙම වර්ෂය තුළදී අවසන් කර ඇත.

## v. සංස්ථා අංශය

රජයේ සංස්ථාවලට, ව්‍යවස්ථාපිත ආයතන වලට සහ විවිධ අර්ධ රාජ්‍ය සංවිධානවලට ඔවුන්ගේ නෛතික ගැටලූ සඳහා සහනදායි මුදලකට සහාය වීම අරමුණු කොටගෙන 1990 වර්ෂයේදී මෙම ඒකකය පිහිටුවන ලදී.

2018 වර්ෂයේදී එහි ගොනු **2088** ක් විවෘත වූ අතර, ගොනු **2365** ක් අවසන් කරන ලදී.

**සංස්ථා අංශයේ විෂයයන් වර්ගීකරණය කිරීම.**

CA – රජයේ ආයතනය විත්තිකරු හෝ වග උත්තරකරු වන නඩු

C – රජයේ ආයතනය පැමිණිලිකරු හෝ අභියාචක වන නඩු

E – උපදෙස් ගොනු

BCL - ගිවිසුම්

ARB - බේරුම්කරණ

SPC – පළාත් සභා ව්‍යවස්ථාවන්

L – ඉඩම් අත්පත් කර ගැනීමේ නඩු

WB - හිඟ ජලබිල් පත් අයකර ගැනීමේ නඩු

**<u>සංස්ථා අංශයේ කාර්ය සාධනය</u>**

| විෂයය | විවෘත කළ ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කළ ගොනු සංඛ්‍යාව | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| **CA** | - | 850 | 1305 |
| **C** | - | 597 | 1917 |
| **E** | - | 276 | 293 |
| **BCL** | - | 14 | - |
| **ARB** | - | 16 | 10 |
| **FC** | 02 | 04 | 03 |
| **SPC** | 04 | 06 | 06 |
| **L** | 02 | 09 | 22 |
| **WB** | - | 01 | 10 |
| **BLA** | 217 | 203 | 743 |
| **E** | 268 | 198 | 70 |
| **CA/SC** | 213 | 07 | 206 |
| **CA/CA** | 218 | 11 | 207 |
| **CA/HC** | 273 | 12 | 261 |
| **CA/DC** | 268 | 04 | 264 |
| **CA/MC** | 03 | 03 | 00 |
| **CA/LT** | 143 | 10 | 133 |
| **CA/NA** | 12 | 06 | 06 |
| **CK** | 42 | 42 | - |
| **C/HC** | 27 | 06 | 21 |
| **C/DC** | 70 | 02 | 68 |
| **C/MC** | 76 | 07 | 69 |
| **C/SC** | 03 | - | 03 |
| **C/CA** | 02 | - | 02 |
| **C** | 162 | 37 | 125 |
| **BCL** | 49 | 43 | 06 |
| **ARB** | 34 | 01 | 33 |
| **Total** | **2088** | **2365** | **5783** |

## vi. ළමා අපචාර නඩු ඒකකය

නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කරනු ලබන ළමා අපචාර සහ කාන්තාවන්ට එරෙහි ලිංගික වැරදි වලට අදාල නඩු ඉක්මණින් අවසන් කිරීමේ අරමුණින් මෙම ඒකකය 2004 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

දාහතර දෙනෙකුගෙන් සමන්විත අතිරේක කාර්ය මණ්ඩලයක් ද සමග තරුණ නීතිඥවරුන් **29** දෙනෙකු මෙම ඒකකයේ රාජකාරි ඉටු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් බඳවා ගෙන ඇත.

2018 වර්ෂය තුළදී මෙම ඒකකය විසින් එවැනි නඩු විශාල සංඛ්‍යාවක් මෙහෙයවන ලදී. 2018 වර්ෂයේදී නඩු **2717** ක් අවසන් කර ඇති අතර **16084** ක් ඉතිරි වී ඇත.

## vii. මහජන පැමිණිලි ඒකකය

සාමාන්‍ය මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි වලට යම් සහනයක් සැලසීමේ අරමුණින් එම පැමිණිලි මෙම ඒකකයට යොමු කරනු ලැබේ. වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සිව්දෙනෙකු මෙම පෙත්සම් පිළිබඳව කටයුතු කිරීම පවරා ඇත

ඉහත එක් එක් අංශයන්හි 2018 වර්ෂයේ කාර්ය සාධනය පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය

| ශාඛාව | 2018 ඉදිරියට ගෙනා ලිපි ගොනු සංඛ්‍යාව | විවෘත කල ලිපිගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කල ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කල ගොනු සංඛ්‍යාව | ඉතිරි ගොනු සංඛ්‍යා |
|---|---|---|---|---|---|---|---|
| * සිවිල් අංශය | - | 2890 | - | 1490 | - | 612 | 452 |
| අපරාධ නඩු අංශය | 14080 | 3425 | 2544 | 890 | 253 | 3717 | 13581 |
| * රාජ්‍ය නීතිඥ අංශය | 8534 | 2523 | - | - | - | 4137 | 6920 |
| ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය | 847 | 496 | - | - | - | 498 | 845 |
| සංස්ථා අංශය | 6122 | 2088 | - | 268 | - | 2365 | 5783 |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | 17582 | 2057 | 1885 | 667 | 165 | 2717 | 16084 |
| මහජන පෙත්සම් අංශය | 619 | 672 | - | - | - | 823 | 468 |

* සිවිල් අංශය මගින් විවෘත කරනු ලබන ගොනු වලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබන බව සලකන්න

## viii. ආයතන අංශය

ආයතන ශාඛාව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යයන් සුමටව ඉටුකර ගැනීමට ආයතනික වශයෙන් සහාය වෙමින් නිහඬ මෙහෙවරක් ඉටුකරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුවේ අනෙකුත් ශාඛාවන්ට සාපේක්ෂව බොහෝ දුරට ප්‍රමාණාත්මක දත්ත මගින් කාර්ය සාධනය ඉදිරිපත් කළ නොහැකි බැවින්, ආයතන ශාඛාවේ 2018.01.01 සිට 2018.12.31 දක්වා වූ කාලච්ඡේදයට අදාල කාර්ය සාධනය පහත පරිදි දක්වා ඇත.

- **බඳවා ගැනීම්, පුරප්පාඩු පිරවීම් හා තනතුරු ඇති කිරීම්**

**නීති නිලධාරීන් :-**

- 2018.12.17 රජයේ අධිනීතිඥ තනතුරට නිලධාරීන් 49 දෙනෙකු බඳවා ගැනීම

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය :-**

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නව බඳවා ගැනීම් සිදුකිරීමේදී නවක නිලධාරීන් 49 දෙනෙකු නීතිපති දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇත.

- රජයේ පුස්තකාලයාධිපති සේවයේ පැවති පුරප්පාඩු 3 සඳහා නිලධාරීන් තිදෙනෙකු පත් කර ඇත

**දෙපාර්තමේන්තුගත තනතුරු :-**

- දෙපාර්තමේන්තුගත ලඝුලේඛක තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමැතියට ඉදිරිපත් කර ඇත

**කනිෂ්ඨ සේවක :-**

- රියදුරු සේවයේ තනතුරු 12 කට අදාල බඳවා ගැනීම් සිදු කර ඇත.

- ආංශික අධීක්ෂණ යෝජනා අනුව කාර්යාල සහකාර සේවයේ තනතුරු 110 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර ඇත

- **නිවාඩු පරිගණකගත කිරීම**

දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරින්ගේ හා සේවකයින්ගේ නිවාඩු, අදාල ලේඛණ වල ඇතුලත් කිරීමට අමතරව, ඒ සඳහා විශේෂයෙන්ම සකස් කල පරිගණක මෘදුකාංගයක් යටතේ නිවාඩු පරිගණකගත කිරීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. මෙහිදී මාණ්ඩලික නිලධාරීන් විසින් නිවාඩු ලබා ගැනීමේදී (විදේශ නිවාඩු හා විශේෂයෙන් ලිඛිතව අනුමැතිය ගත යුතු නිවාඩු හැර) නිලධාරියා විසින්ම පරිගණකය හරහා එවලේම (Online) සිය අධීක්ෂණ නිලධාරියාට අනුමැතිය සඳහා ලැබෙන සේ නිවාඩු අයදුම් කල හැකි ආකාරයට පරිගණක මෘදුකාංග පද්ධතිය සකස් කිරීමට කටයුතු සිදුකෙරෙමින් පවතී

- **ආපදා ණය ලබා දීම**

ආපදා ණය ගෙවීමේදී ඉල්ලුම්කරුවන් පොරොත්තු ලේඛණයේ දීර්ඝ කාලයක් රඳවා ගැනීමකින් තොරව ඉතා කඩිනමින් ආපදා ණය ගෙවීමට කටයුතු කර ඇත.

2018.01.01 සිට 2018.12.31 දක්වා ආපදා ණය ඉල්ලුම් කිරීම හා ගෙවීම පිළිබඳ දත්ත පහත පරිදි වේ.

| **තනතුර** | **ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව** | **ණය මුදල් ලැබූ සංඛ්‍යාව** |
|---|---|---|
| මාණ්ඩලික | 08 | 09 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය හා අනෙකුත් සේවා | 52 | 65 |
| කාර්යාල සේවක සේවය | 45 | 60 |
| රියදුරු | 37 | 38 |

- ❖ **ඉල්ලුම්කරුවන් සංඛ්‍යාවට වඩා ණය මුදල් ගෙවූ සංඛ්‍යාව වැඩි වන්නේ 2018 පොරොත්තු ලේඛණයේ සිටි අයට ණය මුදල් ගෙවීම හේතුවෙනි**

ඒ අනුව 2018.01.01 සිට 2018.12.31 දක්වා වූ කාලය ඇතුලත රුපියල් 23 844 132 /- ක මුදලක් ආපදා ණය ගෙවීම සඳහා රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමෙන් වැයකර ඇත.

- **විශ්‍රාම වැටුප් ගෙවීම**

නිලධාරියෙකු හෝ සේවක මහත්මයෙකු විශ්‍රාම යාමේදී විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය සියලුම ලියකියවිලි සකස් කර අප්‍රමාදව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සළස්වන අතර, ඒ අනුව අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප සහ/හෝ පාරිතෝෂිකය ලබා ගැනීමට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට/සේවකයින්ට හැකියාව ලැබී ඇත.

ඒ අනුව 2018 වර්ෂයේ විශ්‍රාම යන ලද **17** දෙනෙකුගෙන් 16 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂික 2018 වර්ෂයේදීම ගෙවා ඇත.

- **පුහුණුව හා භෞතික සම්පත් ලබාදීම තුලින් මානව සම්පත් සංවර්ධනය**

➢ **විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා නීති නිලධාරීන්ට විදේශගත වී පුහුණු වීම සඳහා අවස්ථාව ලබා දීම**

➢ **රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් ලබා ගත් පුහුණුවීම්**

  - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තාමේන්තුව විසින් සංවිධානය කරනු ලබන පොත් බැදුම්කර පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීම
  - නිපුණතා සංවර්ධන අරමුදල මගින් පවත්වනු ලබන පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම පිළිබඳ පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීම
  - නිපුණතා සංවර්ධන අරමුදල මගින් පවත්වනු ලබන තිවාඩු ලිපිකරුවන්ගේ කාර්යය පිළිබඳ පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීම
  - ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය මගින් පවත්වනු ලබන කාර්යාල කළමණාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීම
  - ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය මගින් පවත්වනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීම
  - මිලෝදා ආයතනය මගින් පවත්වනු ලබන වැටුප් සැකසීම පාඨමාලාව සඳහා නිලධාරීන් තිදෙනෙකු සහභාගී වීම
  - භාෂා පරිවර්තන පාඨමාලාව(කැළණිය විශ්වවිද්‍යාලය)සඳහා නිලධාරියෙකු සහභාගී වීම
  - ජාතික විද්‍යා පදනම Digital library පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීම
  - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය - මුදල් රෙගුලාසි පාඨමාලාව සඳහා නිලධාරීන් හතර දෙනෙකු සහභාගී වීම
  - DCL ආයතනය මගින් පවත්වනු ලැබූ රාජ්‍ය අංශයේ කළමණාකරනය පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීම
  - දෙමළ භාෂාව පිළිබඳ පාඨමාලාව සඳහා 2018 වර්ෂයේ නිලධාරීන් **43** දෙනෙකු පමණ සහභාගී වීම

**ix. සැලසුම් අංශය**

- **යටිතල පහසුකම් සංවර්ධනය**

○ මෙම දෙපාර්තමේන්තුව සඳහා ඉදිවන නව ගොඩනැගිල්ල -

❖ මහල් 12 ක් ඉදිකිරීමේ කටයුතු අවසන් වී ඇත.

❖ ගොඩනැගිල්ලේ අභ්‍යන්තර වෙන්කිරීමේ ( partition )කටයුතු මහල් 11 ක අවසන් වී ඇත.

❖ සිවිලිමේ වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී.

❖ විදුලි රැහැන් ඇදීමේ හා ඇලුමිනියම් වැඩ 80% අවසන් කර ඇත.

○ මන්නාරම රජයේ අධිනිතිඥ නිල නිවස-

❖ ව්‍යුහාත්මක වැඩ 70 % අවසන් වී ඇත.

❖ වහලය දක්වා බිත්ති බැඳ ඇති අතර ඉතිරි වැඩ කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා දී ඇත.

○ වවුනියා රජයේ අධිනිතිඥ නිල නිවස-

❖ විදුලි රැහැන් ඇදීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

❖ මුල් සැලැස්මට අනුව සම්පූර්ණ ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇත.

❖ එසේ වුවද පසුව එක් කිරීමට තීරණය කරන ලද පොලිස් මුර කුටියේ, රියදුරු කාමරයේ හා කුස්සියේ වැඩ කටයුතු ආරම්භ කර ඇත.

❖ මෙහි භෞතික වශයෙන් කාර්ය සාධනය 93 % ක පමණ කටයුතු අවසන් වී ඇත.

❖ අභ්‍යන්තර ඉදිකිරීම් ලෙස නාන කාමර උපාංග හා වායු සමීකරණ යන්ත්‍ර සවි කර අවසන් කර ඇත.

x. ගිණුම් අංශය

<u>2018.01.01 සිට 2018.12.31 දක්වා වැය විස්තරය</u>

ශීර්ෂය 229 වැඩසටහන 01 ව්‍යාපෘතිය 01

**2018.01.01 සිට 2018.12.31 දක්වා පුනරාවර්තන වියදම්**

| වැය විෂය විස්තරය | අයවැය ප්‍රතිපාදන | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම් |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 466,000,000 | 921,290,000 | 919,614,161 |
| අනෙකුත් පුනරාවර්තන | 273,000,000 | 287,750,000 | 287,181,125 |
| **එකතුව** | **739,000,000** | **1,209,040,000** | **1,206,795,286** |

රු

**2018.01.01 සිට 2018.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්**

| විෂය හා විෂය අංකය | අයවැය ප්‍රතිපාදන | ශුද්ධ ප්‍රතිපාදන | ශුද්ධ වියදම් |
|---|---|---|---|
| 2001-ගොඩනැගිලි සහා ඉදිකිරිම් | 6,000,000 | 7,500,000 | 7,500,000 |
| 2002-යන්ත්‍ර සහා යන්ත්‍රෝපකරණ | 2,000,000 | 3,800,000 | 3,748,570 |
| 2003-වාහන අළුත්වැඩියා කිරිම් | 4,500,000 | 6,500,000 | 6,500,000 |
| 2101-වාහන මිලදිගැනීම් | - | - | - |
| 2102-ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 8,000,000 | 6,200,000 | 6,184,153 |
| 2103-යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදි ගැනිම් | 7,000,000 | 3,500,000 | 3,500,000 |
| 2014-ඉදිකිරිම් | 429,000,000 | 399,000,000 | 317,236,171 |
| 2401-කාර්යමණ්ඩල පුහුණු කිරිම් | 28,000,000 | 58,000,000 | 57,515,940 |
| **එකතුව** | **484,500,000** | **484,500,000** | **402,184,835** |

<u>2018.01.01 සිට 2018.12.31 දක්වා අත්තිකාරම් ගිණුම</u>

රු

| | වියදමේ උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හර ශේෂයන්ගේ උපරිම සීමාව |
|---|---|---|---|
| අනුමත සීමාව | 24,000,000 | 15,000,000 | 80,000,000 |
| සත්‍ය | 28,801,743 | 27,884,321 | 49,927,849 |

<u>2018.01.01 සිට 2018.12.31 දක්වා ආදායම් ගිණුම</u>

රු

| ආදායම් ගිණුම් අංකය | 2018 ඇස්තමේන්තුව | 2018 සත්‍ය ආදායම |
|---|---|---|
| 20.03.02.11 | 40,000,000 | 64,610,665 |